# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1906/50 - 2015 මාර්තු මස 21 වැනි සෙනසුරාදා - 2015.03.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත
### 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ දැන්වීම

### මිනිපේ ප්‍රාදේශීය සභාව

මිනිපේ ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන බණ්ඩාරනායක මුදියන්සේලාගේ ශාන්ත සිසිර කුමාර බණ්ඩාරනායක මහතා, එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධුරය ඔහු විසින් අතහැර ඇති බව මිනිපේ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී මුදියන්සේලාගේ කුමුදු සමන් ශ්‍රී රත්නායක වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

සමන් ශ්‍රී රත්නායක,
තේරීම් භාර නිලධාරී,
මිනිපේ ප්‍රාදේශීය සභාව.

2015 මාර්තු මස 20 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මහනුවර.

04 - 210

---

### 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල
### පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත
### (262 වන අධිකාරය වූ)
### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ
### වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ
### සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම

මිය යාම හේතු කොට ගෙන වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ගුණතිලගේ ආරියවංශ නම් වූ තනතුර දැරූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු

1A - G 21251— 37 (2015/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත්, ඒ වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ගුණපාලගේ සරත් මධු මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී අබ්දුල් ඔෆූර් මුහම්මද් නෆීල් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ගුණපාලගේ සරත් මධු මහතා වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. ඕ. එම්. නෆීල්,
තේරීම් භාර නිලධාරී,
වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාව.

2015 මාර්තු මස 20 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
වවුනියාව

04 - 211

---

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත**
**10අ(1)(අ) වැනි වගන්තිය යටතේ දැන්වීම**
**කුරුණෑගල ප්‍රාදේශීය සභාව**

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන මොහොට්ටාලලාගේ තිලිණ ධනුෂ්ක ඒකනායක මහතා, එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධුරය ඔහු විසින් අතහැර ඇති බව කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කර සිටිමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම් භාර නිලධාරී,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2015 මාර්තු මස 20 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

04 - 212

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.